
# නීලකොබෝ සන්දේශය.



බරණ ගණිතාචාර්‍යයිගේ

නොයෙක්ප්‍රබන්ධ සහ ගැටපදවිවරණයක්ද අන්තර්ගතයි.

---

ඇල්බට්ද සිල්වා මහත්මයා විසින්

සකස්කරණලදී.

---

බී. ජේ. පෙරේරා මහත්මයා

විසින්

ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි

මුද්‍රණයකරවා ප්‍රසිද්ධකරණලදී.

1896.

# බරණ ගණිතාචාර්‍යයා.

මොහු ක්‍රි. ව. 1780 දී ලඞ්කා රාජ්‍යශ්‍රියට පැමිණි රාජාධිරාජසිංහ මහරජානන් දවස සිටි සඟරාජ, තිබ්බටුවාවේ, දිසානායක, දුනුවිල පත්තායමේ ලේකම, කරතොට, මොරතොට, කටුවාණේ සාලිඇලල, කිරඹ, ගල්ඇටුඹෙ, යනාදි ප්‍රසිඬ උගතුන්ගේ සඞ්ඛ්‍යාවට ගනහැකි කෙනෙකි * මෙම ගණිතයා නක්‍ෂත්‍රයට පමණක් නොව කාව්‍ය ශාස්ත්‍රයටද සමර්ථයෙක් බැව් කියා තිබේ. මොහු විසින් පොතක් වශයෙන් කරතිබෙන්නේ නීලකොබෝසන්දේශය පමණකි. නුමුත් වෙනත් නොයෙක් කාරණා ගැන මොහු විසින් කරණලද ප්‍රබන්ධ බොහෝ තිබේ.

නීලකොබෝ සන්දේශය රචනාකර තිබෙන්නේ මොහුට හට ගත් රෝගයකින් සුවය ලබාගැනීමට කතරගම දෙවියන් ගෙන් ඉල්ලීම සඳහාය.

මෙම පොතේ සමහර තැන්වල සංස්කෘත වචනාදිය යොදා තිබේ. නුමුත් මෙම සන්දේශය ඇසුවන් සිත් ප්‍රියවඩන පරිද්දෙන් ගළපාතිබෙන බැව් කීමට කැමැත්තෙමු.

බරණ ගණිතයා වස්කවි කීමෙහිද ඉතා දක්‍ෂයෙක් බැව් කියති. එකාවක් ඔහුගේ නිවෙසේ සරණමඞ්ගල්‍යයක් සිදුවී ඊට මාලු නොලදින් දඩයමේ ගියකල ඔලුමුවෙකු දැක තුවක්කුවගැස්සුවේවීනුමුත් පත්තුනූනේලු. එකල මෙහි පහත දක්වන කවිය එතනම සිටගන කී කෙණෙහිම මුවා නැවතුන බැව් කියති. ඒ කවිය මෙසේයි:—

* In 1780 Rajadi-Rajasingha; the brother of Kirtissree, ascended the throne. He was the brightest luminary around which clusters of literary stars shed their delightful brilliency. As in the last glimmer of a torch, when the expiring flame suddenly flashes a bright light and then disappears; so, there now lived a number of literary men, with whose existence ceased all the glory which was attached to the literature of Ceylon. Now lived Sanga Raja, Tibbotuwawe, Dissanayaka, Dunuwilla, Patteyame Lakama, Karatota, Saliella, Kiramba, Moratotta, Katuwana Mohandiram, Barana Ganitaya and Meeripenna,-names which cannot but be respected by every lover of his country's literature-James Alwis, Sidatsangara, page, ccxxxi.

යා ලූ වේ මෙමට කළ අවමාන්නෙ ඔ
වේ ලූ වෞ තිත්තකඩසින් බඳින්න ට
මා ලූ වේ දෙයක් නැත මුසුකරන්න ට
ඕ ලූ වේ නොගොස් සිටපන්න මඟුල ට

මොහු විසඩාසව සිටි සත්‍රියක් අත්හැර ගිය බැවින් කී කවිදෙකක් මෙසේයි:—

අ ත් බ ර අයුද දරමින් සිටිකද කුම ර
ජිත් තෙ ද අසුර යුදවනී ජය ගතෝ පෙ ර
ප ත් ක ර නුඹුනි නම් මගෙ සුපුරුදු සොඳු ර
අ ත් අ ර වා ගණිමි මම තගෙ කදිර පු ර

ප ච රා කදිර පුර පුදලබනා තු මි මා
නොහැරා මම කියමි මගෙ දුක වැදනී මි මා
ප ච රා නුඹුනි නම් මගෙ දිගැසිය න මි මා
උ දු රා මම ගණිමි තගෙ වල්ලි අ මි මා

මොහු විසින් වවනලද තම්පලා ගස් වගයක් සොරු උදුරාගත් තාට කී කවි තුණක් මෙසේයි:—

1 ලො ව ට වැඩකර මදක් උපකාරයෙන් ඉන්නට දවසැ රා
ක ට ට රස ඇති මාළුපින්නක් වවාගන්නට පළක රා
ච ට ට වැටබැඳ තම්පලාගස් උනිමි මම දැඩිවෙනතු රා
හැ ට ට දෑකර වැදූවෙසිගෙ දූතෙක් උදුරා ගතිසො රා

2 ච වා තිබුනු තම්පල ගණිතෙගෙ ව ත් තේ
මු වා වෙන් ඇවිත් සොරු උගුලා ග ත් තේ
කි වා මෙපද බොරු නැහැ අනෙ හරිස ත් තේ
එ වං පන් මල්ලි උඹෙ අඹු මේ පැ ත් තේ

3 මෝට වාගේ කමට අපෙනුත් ගියා නොගියා බෑ කියන්න ට
ඊ ට නෑකම් දූනට මොටිදෑ තව වවාදෙමි තම්පලා ත ට
කා ට වත් නොකියාම රහසේ අඹුවගෙණදුන්නොතින්මාහ ට
ඇ ට පිකකලකින්ම පුළුවනි ගණිතපැටියෙක් සදගන්නට

කොමිනක් සොරු ගත්තාට කී වස්කවි:—

මු රු අ ණ බෙලෙන් රෝදූස් ගත වැඩි ග න්
දෙ රු ව න වදින ඉස්සන් බඩ ඉරා ග න්
කිරු මෙ න තරාදිය බරණින් බලා ග න්
ගු රු දි න කොමින ගත්තෙකු යකු මරා ග න්

බ ගි න ජලය මෙන් සියගත ඇදී ය න්
න ගි න ගහෙන් උගුලෙන් උල ඇනී ය න්
බ ගි න බැම්මවල හැරපට කැඩී ය න්
කො මි න ගත් සොරා හතරට පැලී ය න්

කා ළු ව න තැනාස යන් රූපාන නොවැල කූ
මැලිනොව සිතේ කැපකරගන්න බිල්ල කූ
මුළු ලො ව බලන තෙද ඇති මහසොහොන් ය කූ
අළු කා ර ගත්න අල්ලා කෙමින ගත් තෙ කූ

මොහු විසින් සත්‍රියක් සඳහා කී කවිදෙකක්:—

සුරින් දගේ අඟනන් මෙන, බරින් බිමට බවුසන්දන,
කිරින්දෙ සිට ඇවිදින් යන, බිරින්දගේ සොබ නා
රුවින් ඈගේ යසසින්වන, රතින්දගේ ඔදසින්දන, ලෙ
සින් කියමි එලඳුන් ගුණ, සිහින් හැඟෙන පම ණා
තදින් තකට දිම්තොංයන, පදින් නටන ඈගෙ පූත්තන,
ඊරන්හිසර පැටියන්මෙන, නෙතින්නෙතට පෙණෙණ නා
මෙවන් අඟන මට දැන්ගෙණ, විඳින්ඩ රතිසැප දුන්තැන,
ඔවුන්ඩ දෙමි මසුරන් ගැණ, රැකෙන්ඩ මටහිබෙ නා

රූ වී න් සඳිසි සිරිකල්වන, නුවන් යුගැති ඉඳුනිල්වන, කුසුම්
වරල සිකිපිල්වන, ගනන් අකුස විල සා
ලෙවන් අදර වදමල්වන, දසන් පෙලඳ කොඳතුල්වන,
වදන් කියන සුරතල්වන, පෙමින් බලන අඬැ සා
සූ පූ න් දෙතන සුලකල්වන, පෙදින්පෙදට නිහිසෙල්වන,
සෙදින් සලෙළු මන අල්වන, ලෙසින් හසිනි තොල සා
මෙවන් රුසිරු තුඹෙ දුල්වන, කුසුම්සරුගෙ ඔදසොල්
වන, විඳින්ඩ රතිසැපකල්වන, වරෙන් පියඹ විග සා

අදිරියා නම් කොළුවා සිව්රුඇර ගියාට මොහු විසින්
කී කවිතුණක් මෙසේයි.

යස සරැ සින් දිසිරවිවිලසින් නමදිම් සතොසින් ඔබයුගපදෙසා
නෙකදිවයින් අපමුනිඳුවිසින් දෙසූ සිකපද සූ න් කාරගියලපූ සා
ලොවදිවැසින් නරඹාවෙසෙසින් රැකිසිතසතොසින්සුරිඳුන්බරැ
නි.යද.ව සි න් මෙගිළුනවිලසි න් නමදිම්සතොසින්ඔබයුගපදෙ

ච න් ද, නොයෙක අසුරි න් ද, වෙතෙහි යුද බි න් ද,
පතළ තෙද මහිමෙ න් ද,
ම න් ද, ර ගි ර වි ල සි න් ද, බ ල ය පා මි න් ද,
විසු සව් දදබ න් ද,
ල න් ද, සු රැ නි කා දි රෙ න් දු, සු රි ඳු නේ වැ න් ද,
මෙන්න ඔබ පද ම න් ද,
තුන් ද, තුරෙන් මෙ හි බි න් ද, එ ව න් සි ල් බි න් ද,
ගමට ගිය හෙ ර ණි න් ද,

අම්බන තු වේ නොදෙමැයි දිව ගණ්ප නී ය
දිය කර ව වේ ආ ෂිම් බර නුව නෑ හී ය
රිසි විල ස වේ පෙරකුරු දූන නොනැව නී ය
යස කර ර වේ පවසන් ඔබගේ තු නී ය

දිනක් රෑ සොරු ගස්වලම සිටගන කුරුම්බා කකා බිමදමන බැව් මොහුට ඇසී අවුත් ඈත සිටගෙණ මෙසේ කීය.

මොකා දෝ එකා මට නොදැනෙයි මේ කා
කා කා කුරුම්බා ගෙඩි බිම දමන එ කා
ය කා ඈට නාහර මස් බිලිගත් සැණෙ කා
වි කා මහයොහොන් දෙව් දිව් හරින් ම කා

එලදෙනෙක් ලිමාවැල් වගයක් කෑවාට කී කවියක්.

පි රි ය සිතින් ඇතිකළ ලිමා වැ ල
ග රි ද රදෑගෙයි එලදෙන කෑ ක ල
නාරි යෙකු නොවටින දිවියෙකු තෝ බ ල
ව රි ය වැටෙනවදෑ අල්ලන් කෑ ක ල

තෙලිදිය සොරකම් කළාට කී කවියක්.

ලා වෙ ලා තුබූ ලා කිතුල්මල තුබූ තෙලිදිය ගෙණ අ ලූ ත්
ඒ බ ලා තුමූ ලා සොරෙක් බීලා ගියා සැළ ගෙණ අ ලූ ත්
ලෝ තු ලා තුමූ ලා පසිඳු යස තෙදබලැති දෙවියනි අ ලූ ත්
ඌ මෙහෙ ලා තුමූ ලා ගසින් හළ මැනවි දැන් නොතබා අ ලූ ත්

ගොයම් කෑමට ආ හාවෙකුට කී කවියක්.

ඉ න් දූ සේම පැලවෙන මගෙ ටිකිරි ගොයම් ක නා වා
ප න් දූ සේම බෙටි ගසමින් බැද්දට පැන ය නා වා
ස න් දි කුලල් නාහර උගේ ඇට පොඩිකරව නා වා
කා න් ද කුමාරු දෙවියනි සාවා මරව නා වා

සොරු වතුකැනක් කපාගත්තාට කී වස්කවියක්.

ව න් න පා කිරණය අවරටපත ඉ න් උපා බලමින් ඇවිදි ලලා
පෙම් ප පා රෑකළුන්මගෙලා වතුකැන්කපාගනගියසොරකො
කාන් දෙපා සූකර දිවි ගොන්හිස වන්සපා බරණින්යකු දූ ලලා
දෑ න් අ පා නොපටමකැපකරදෙමුළුන්සපාකාපියනොස්අලලා

මොහුගේ ලෙඩක් සුවවූ බැව් දන්වායැවූ කවියක්.

වසූ කැ ල න් මැදට පත් නෙනු ස මා ගේ
දසි කැ එ ම් වැදෙගු ගියමෙන් නො මා ගේ
වීසු පොලො න් නාරුවෙ බිසගුත් තු මා ගේ
ඔසු බෙ ලෙ න් පහවගිය ලෙඩ මෙ මා ගේ

මොහුගේ බලලෙකුඇල්ලු බල්ලාට කී කවියක්.

අද්දර ගමගෙයි බඩගෙඩි බ ලලා
මාගේ බලලගෙ තුනාපිය අ ලලා
අද්දර පදුරේ උන් දිවි පො ලලා
අල්ලන් කාපිය එම හොර බ ලලා

තනනම්කරණලද මුදලිතනතුරක් නැවත ලැබුනාට කී කවියක්.

නිත ර අයබදුවල පනසලැබ නැතක්කල් පෙර පුරුදුවම ඉ ද
අ ත ර කදි වෙන්වෙමින්ගිය තදඅවුල් මැසිවිලි කියන හැමසඳ
ප ත ර ගුණදුරු විජයවද්දන නාවරත්න තෙන්නකොන්හිමිසඳ
මෙවර ගිරුවා අගනා වෙත යලි පිවිස විත් සුබ මඟුල් විය අ ද

මොහු සමහර ස්ථානවලදී ඉතා නිර්ගිතලෙස ක්‍රියාකර තිබෙ න බවද පෙණේ. වතාවක් මොහු එක්තරු වලව්වකට පැමිණ කල එහි මුදලිතුමා ආදි ප්‍රධානීන් මාළුපුල්ලස්සා කකා රුබොනබැව් දැක මේ කවිය කීලු.

පෙරරුස නගා පලහා අන්තිම රා සී
නොමරුස එක්ගහන් දසඑක්වෙනි රා සී
පුහරුසවන් දනෝ එකතුව කර පැ සී
පසරුසලෙසින් විකුමෙන් බස් දෙති වාසී

මොහුසහ පත්තායමේ ලෙකම්ද (සමරජිව) මිත්‍රකමින් විසූ බැව් පෙණේ. වතාවක් මොහුගේ දුක්පත්කම පත්තායමේ ලෙ කම්තැනට දන්වායැවූ කවියක්ද මෙසේයි:

සම ත වරණ මගෙ අබතුරයටම වැ දී
මසු ත අගන වෙහෙසයි සුද දළය දී දී
උදි ත සමර ජීවලිපි මැතිසඳිනි සු දී
ඉව ත උනෙද ඔබ මෙත් සිහ නදය නො දී

තවත් නොයෙක් කරුණුගැන මෙම ගණිනයා විසින් කරණ ලද බොහෝ ප්‍රබන්ධ ඇතත් ඒ සියල්ල සොයාගැණීමට අපහසු බැව් කියමු,

Albert de Silva.

1896 අගොස්තු මස
20 වෙනි දිනදිය,

# නීල කොබෝ සන්දේශය.

1 සරද සර විජය සවණෙව් කළ නා ද
සරද පවතු සුවලෙස නිලකොබෝ ස ද

බැ බ ලූ තුඩදෙසක ගෙල පියයුග කෙමේ නා
ප බ ලූ මුතු වෙරළු ඉඳුමිණි විය සම නා
ලොබලූ දිවඹ ඉන් දිව බරණෙක සිරි නා
නු ඹ ලූ කර ගුවන් ගිස එනකල පැමි ණි

සි ද වි ද ස ඳ සෙද වැද ඝන ගගන ත ලේ
හ ද න ද නොකලොද ලෙද බදනාම ගෙ ලේ

2 දි සුනු ග තෙක නොකළැකි උව ම නා යෙ කා
නුසුනු රස තෙපල නුවුවන ද නා තෙ කා
විසු නු ලපුලු රදුමෙන් දුරු ගු ණ දි කා
දසු නු කරණ තොප අප වාස නා වෙ .කා

3 නොකිනි විකිනි කම්කර පලම රස වි දේ
ර කි නු බඹසරන් මෙන් හිඳින වන මැ දේ
මූ කි නි එක නොකියහැකි රුසිරු ගුණ ක දේ
ද කි නු .වි නම් තොපවැනි මිතුරු තුම සො දේ

4 මිතුරු කුමුදුවෙතවිසු සසරද උදි ත
මිතුරු නොමදුකම් සඳහා නොගොසි ව ත
මිතුරු සැනිදු ඝොරතර මුකයට සැප ත
මිතු රි දු විඳි දුක තමදුක මෙන් විඳි ත.

5 එ බැ වි න් කලණ සබඳිනි ගුණැති ගරුත ර
තගොසින් අප සඳුවෙත කඳිර පුරව ර
සි ඛි ය න් ඇ රු සුරහිමිසඳුට බර ක ර
මෙ අසු න් පඩුර දි සැලකරව තොරතු ර

---

1 දෙසක, ඇස්දෙක; වෙරළු, වෛදූර්‍ය්‍ය; සිදවිදසඳ, සිඩවිදුඩිගනා වො; ගගනතලේ, අහස්තලය.

2 දිසුනු, බබලන; නුසුනු, සුනානුවූ; දසුනුකරණ, දශීනයකරණ.

3 නොකිනිවිකිනිකම්කර, අනුන්ට අවැඩවනලෙස කිසිමාත්‍රයකුත් රෞද්‍රභාවයක් නොකොට; බඹසරන්, බ්‍රහමචර්‍ය්‍යාව.

4 මිතුරුකුමුදු, චන්‍ද්‍රයා; සසරද, හාවා; සැනිදුම්තුරු, රාහු.

5 සිඛියන්ඇරු, මයුරවාහනාරූඪවූ; බරකර, කඳකුමරු.

6 අතගෙප් තපන පත පෑවිට සිසි කිර ණ
නෙකපුප් නඳන වෙද මගෙසිතු කළ එමෙ න
හරිතප් වන කොබෝසඳ මිහිනුරු කල ණ
මගලප් මෙගම සිට අස තයනුරු කර ණ

නානාජන හෘදයානන්දකරවූ විශුඞ විමල ප්‍රභාඇති නිඛිල ස්ථාන මධුර සෞම්‍යමණ්ඩලයකින් හා, තවද ඇඹුල උපුල ශත පත්‍රාදි සතතසමලඞකෘත තටාකෛශ්වර්‍ය්‍යාභිනිෂ්පුක්තවූ නිසවාහ නනම්ග්‍රාමයාගේ විස්තීර්ණ ප්‍රබන්ධයක් කෙරෙම්, මිතුර ඒද කා ශ්‍රවණාලඞකාර කර–

7 සාතු ට වඩන මළුවක් කර පසත් මෙ නේ
ඊ බ ට දන නොහෙති යා නිදිහිඳුම් නු ණේ
ඒ ක ට පවසද්ද විදුදන විසින් පැ නේ
තාසි ට යන ශාමු නාමුය එමෙන් දු නේ

8 සිටිනා කල පොරණ මිණිකිට රද පේ ම
සිටිනා වැඩ දිවාමළුකර පිය ම ම
සිටිනා දූන් මෙතොප අප මෙපියස නා ම
සිටිනා මළුවයයි පැවසූ එනිසා ම

9 මොකැදුරුව න් අපමුනි දෙසූ දම් ආ ල
ක ර අ ස මි න් රකිනා විලසම සි ල
දු සි රි ත ක ම් හැර කර සියලුම ලී ල
සතසතොසි න් වැජඹෙති මෙහි හැම කා ල

10 සර තැස ව න් සතහට මෙහි හැම කා ල
පිය සැනසු ම් කෙරුමට නොකරම කෝ ල
පස් පිසුමෙ න් ගැවසී සිරි නොම ලී ල
නුබගඟමෙන් සිරිසිලිවිල නවයා ල

---

6 අතගෙප්' අසතපවිතය නමැති ගර්භය; තපන, සූර්‍ය්‍යා; පුප්, මල්, හරිතප්වන, නීලවර්ණවූ; ලප්, සලකුණු;

7 යානිදිහිඳුම්, යාම නිද්‍රාගැණීම හා හිඳීම; පැනේ, ප්‍රශ්නය.

8 මිණිකිටරද, මාණික්‍යකිරීටනම් රාජෝත්තමයා, මීම, මෙහිම.

9 සීල, සික්ෂාපදයන්; ලීලකරහැර, මදීනකරහැර.

10 පියසැනසුම්, බීම සහ නැම; නොමලීල, අඩුනැතිව; නුබගඟ, ආකාශගඞාව.

11 වන තඹ රේ  නෙනිඳු ව රේ  කෙසසෙවෙ  ල
ලපි ය පූ රේ  පි ල ති ස රේ  නිතිනුදු  ල
බම ර හ රේ  දැරුනොහැරේ  ගුණ සිලි  ල
එවි ල ස රේ  දුට කා ව රේ  යෙති කිකා  ල

12 පැ හෙ නා  පූ දි නා  එගිවට කොත් වි  ටි ය
ව ර නා  නොමදිනා  කොසිකලවත් යි  ටි ය
දි ලෙ නා  සැමතැ නා  වතු පල රුක් සැ  ටි ය
න ද නා  ගෙළු ය නා  ලදමෙන් සක් ව  ටි ය

13 එ මි න්  කිරුළු රදහට පොරණ නිල  තු රු
කෙ ලෙ න්  පසගතුරු නදලැබම තන  තු රු
බි යෙ න්  නොහැර කරණා විලස අද  තු රු
පු හු න්  කරති සත මෙගි නිතර ගො ස  තු රු

14 තරිඳු ව නා  නෙතුම්ණි පි ය ලි ය  ලව  නා
හසස ම නා  ත න ඝූ ග ගි ජු ලි ය  ගම  නා
මෙපුරග නා  න මි ස ක පි ය ලි ය  නොහෙ  නා
අමුතුවෙ නා  නැ ති ම ය සු ර ලි ය  කිය  නා

15 නෙකද න්  පිත් කර වැජඹෙන සත අසෙ  ස
ද කි මි න්  අමරපති සිතුකරමින් සතො  ස
ඉ සු රෙ න්  නුනුනු ලෙස සැදූ මෙපුරෙහි යස  ස
මු ව කි න්  කතනකර නිම්හැකි වෙද කෙලෙ  ස

මෙසේ අතර මාගීලඞකාරවූ ග්‍රාමයන්ගේ විසතිවණ් කථනාය කිරීමෙන් ඉක්බිති පක්ෂිනෘයාහට යාත්‍රාරම්භයට නක්ෂත්‍ර මුහුර්තී නියෝග කරන්නාවූ ජ්‍යොතිෂචාරාදිවූ ගුත්‍ථපදෘදියකොට දක්වමි. ජ්‍යොතිෂචාරාකේ බානිවදසාඝෝති තෞලි ලගනගාපරමොඃඞයාන් සහ යාත්‍රායම් ශුභයමඃතම්—

---

11 පිලතිසරේ, හංසපැටව්; හරේ, මුතුවැල; එවිලසරේ, ඒ විල නැමති සත්‍රිය,

13 ඒමින්කිරුළුරද, ඒ මාණික්‍යකිරිටරාජයා; අදතුරු, අද්දක්වා; පුහුන්කරති, ප්‍රගුණකරත්.

14 තරිඳුවනා, චන්ද්‍රයාවැනි මුහුනක්ඇති; පියලිය, මෝරාඞකුරවැනිවූ; ගිජුලිය, ඇතින්නී; සකපිය, ඇස්පිය; ලියනොහෙනානම්, නොසොල වත් නම්.

15 අමරපති, ශක්‍රයා; නුනුනුලෙස, අඩුනැතිපරිද්දෙන්.

16 දි නි සු රු   රිකය සැරතිනිගුරු දිනස   ම් බා
දි න ගු රු   ලඟින් මැදපත්විට රිවිබි   ම් බා
සි හි ක රු   ඇතිවතම සූරකුල නොකල   ම් බා
ම ෂි තු රු   මෙපිය සින්කර ගමනා ර   ම් බා

**නවද** මේ අසිතද්ධ්‍යාදියෙන් විනිර්මුක්තවරයෝග්‍යයයි යන නක්ෂත්‍ර මුහුර්තාදියක් දක්වා ඉක්බිති ශුභ වඩිනා ලක්‍ෂණදනන හැක්කාවූ ශුභ නිමිත්තය දක්වන්නාවූ පිරුණුකලසාදින් කියති.

17 පි රු ණු   කලස හෙලපුප් ගව පසවිය   න
න රු ණු   දිගැසරාමුසු පියබස් කිය   න
සැරු ණු   පතස දිදුට සුබ මේ කිය   න
කා රු ණු   සතොස ලෙස සකි සිදුවේ තය   න

**මෙසේ** මේ ශුභ අභිසිඞියවන්නාවූ ශුභවර යෝග්‍යයයි යන නක්ෂත්‍රයක්හා ශුභ නිමිත්තය දක්වා ගමනට නියොගකරන්නාවූ නෙකරටිනා යනාදියකොට කියත්—

18 නෙ ක ර ටි නා   වැදයනෙනාගන ලත   ර
ක ළ තු ටි නා   රණනදනා වැනිරුසි   ර
ම නා තු ටි නා   නිතිකෙළිනා සලෙළුව   ර
දූ කා සි ටි නා   මළුවෙලිනා යව එත   ර

19 ඉ වු ර බ ලා   දෑරෙගිරිදි මෙකුළ මේ   න
ඉ ම බ බලා   විටකෙක ඉඳුමිණ සම   න
ඉ සි ය ඹ ලා   තුරුමුදුනෙහි නලහම   න
ඉ දු ර බ ලා   හිඳුපහවනතෙක් ගිම   න

20 න බෝ   තල පැමිණි රිවිකිරණය ව   න් ඩ
නොබෝ   කලබලා තම තුනු සැනසෙ   න් ඩ
සෙ බෝ   ලොල නැමද සම්මුක සුරිඳු   න් ඩ
කො බෝ   නිල එසින් නැගියාගත් ය   න් ඩ

---

**17** හෙලපුප්, සුදුමල්; පසවි, පඤ්චායුධ; රාමුසු, රාගයෙන්මිශුවූ; පතස, මාගීයඅසල.

**18** ලතර, යෞවනයෙන්තරවූ; නාරණනදනාවැනි, අනඩගයාවැනි

**19** බලාදෑරෙහි, ප්‍රතිෂ්ඨාධාරයෙහි; ඉම, එහිම.

**20** නබෝතල, අහස; නොබෝකල, මදකාලය; සම්මුකසුරිඳුන්ඩ; කතරගමදෙවියන්ට.

21 ලො බ ලා  කාමීන් දින පලරස නොවන් කි  ස
බ  බ ලා  ඉඳුම්ණිසෙ සිකි එගි තුරන් ගි  ස
එ  බ ලා  නොසව ගියහොත්වෙයි ගමන් ප  ස
කු  ඹ ලා  දෙනිය සිරිනරඹන් එයින් බැ  ස

22 බෙ ලෙ න්  සරුවිස්මකම් සුරවැද අස  ල
කා  ළෙ න්  සුරු සීහවග සිතුයම්නිදු  ල
ප  ලෙ න්  පිරු කඳුරුරුක වෙත ගිදනොස  ල
පොලො න්  නරුවෙලස සැදී අම්බලම් බ  ල

23 ගි ම හි රු  වන දනන් එම මඩුවටා ප  ත
පි වි තු රු  කෙතඹ එකෙණෙහි නොම කොටා සි  ත
ග න සු රු  පන සලත වටරුක් වටාප  ත
එ හි සු රු  දුටු තසිතනෙක සහතුටා වෙ  ත

24 ත ද නෙ ලෙ නා  ලෙලදෙන තරඟින් නිත  ර
රැ ළි දී  ලෙ නා  මුතුසක් පබලැති පත  ර
න ද  කා  ර ණා  දුටුදන මනසක් නිත  ර
ව දු  ගො  සි නා  තංගලු වැල්ලට මිතු  ර

25 අ ත්  ගිර නිවෙස පත්වූ එවිට දිනිසු  රු
ස ත්  ලොව එව්ගසක්වූ සෙවෙනි ගනඳු  රු
ව ත්  සය සුර මහත් තෙද පිහිට ගෙණස  රු
සි ත්  ලෙස නිද රුකක් අගනෙරළු පිවිතු  රු

26 ය ලී  දිවස  කරපෙර ගිරදොරටවැ  දූ
දි ලී  සරස වෙල් දදබන්නෙද එස  දූ
ඇ ලී  සිටින සක නිදිගැට හැර පැහැ  දූ
මැ ලී  නොව ගුවන නැගියාගත් සබ  දූ

---

21 කිසනොවන්, අඩුනැති.

22 විස්මකම්සුර, විශ්වකර්මනම් දිව්‍යපුත්‍රයා; වග, ව්‍යාඝ්‍ර.

23 ගිමහිරුවන, සූර්‍ය්‍යසන්තාපය වන්නාවූ; කෙතඹ, කෙතනමැති ස්ත්‍රිය; ගනසුරුපන, මේඝනමැති අතින්; වටරුක්වටාපත, නුගගස් න මැති විජිනිපත්‍රය.

24 නෙලෙනා, සුලඟින්.

25 අත්ගිරනිවෙස, අස්තපර්වත නමැති නිවෙස; දිනිසුරු, සූර්‍ය්‍යා, වත් සයසුර, සනත්කුමාරයා.

26 දිවසකර, සූර්‍ය්‍යා; සරසවෙලදද, අරුණවලාහක නමැති ධ්වජය; සක, නෙත්‍රය.

27 පි ය වෙ ල් ලේ   තුලමෙන් වසුදර පැහැ   ද
දි ලි සි ල් ලේ   දවලති පුලිනය නොම   ද
සිත ලො ල් ලේ   කරමින් තොප එදුවූ ස   ද
ය ව වැ ල් ලේ   පතයෙන් අරණිතට වැ   ද

28 ත ව නා   මෙහි සතුන් පත්වූකල එදි   නා
කොව නා   ඉඟි ඇතත් තෙපලා සිතුලෙසි   නා
දෙව නා   රිසි මදුරපලකා මන නඳි   නා
ප ව නා   විද එවන පෙදයන් සකිසඳි   නා

29 හ ඬා   යන සිලිලයෙහි සමුදුර අත   ර
ඉ ඬා   නොව සිටින කුඹිලය මින්පත   ර
ස ඬා   නන සුරිඳු අණ සිඟිකර මතු   ර
කු ඬා   තොටින් සබඳිනි යාගත් එත   ර

30 කු ම් බි ල් ලේ   සහ දුතිමෝරුන් තුතු   ර
මන් ලොල් ලේ   කර ගොදුරට එන නිත   ර
තං ග ල් ලේ   මෝදරපැන නොව අතු   ර
ක ණ් ඩු ල් ලේ   වනමැද යාගත් මිතු   ර

31 ල ව න්   ජල පිලිය කෙළිනා මි   නේ ග නේ
ලෙ සි න්   දිලි සිලිය රලපෙල තැ   නේ තැ නේ
ගු ව න්   මගදිලිය මින්තොප ය   නේ දි නේ
පෙ රු න්   කල් එලිය සමුදුර මෙ   නේ පෙ නේ

32 ලො බ ය   කර සිලිලයට එඟි විත්සි   දු ව
උ බ ය   පස සිටින ගජගිරි කුළු බ   දු ව
ද ඹ ය   පොකුණ දැක මෙම ලකුණෑති රු   දු ව
අ බ ය   වම මිතුරගොස් රැක වට ව   දු ව

---

27 පියවෙල්ලේ, පාවාඩ; වසුදර, මහිකාන්තාව; දවලතිපුලිනය, ඉතාසුදුවැලි; පතයෙන්, මාර්ගයෙන්.

28 තවනමෙහි, තාගේ ගෝත්‍රයෙහි; පෙද, ප්‍රදෙශය.

29 කුඹිලය, කිඹුලුන්; මින්, මත්ස්‍යයන්; සඬානනසුරිඳු, කතරගම දෙවියන්.

30 තුතුර, චතුරවූ.

31 ලවන්ජල, ලුණුවතුර, මිනෙන්, මත්ස්‍යයන්.

32 සිලිලයට, දියයට; උබයපස, දෙපැත්තේ; අබයවම, නිර්භයවම

33 දෙ ත ර ලෙලෙන ගින්තුරුපලද බරි ත
ප ත ර එපිළි බිඹු අඟි බවනෙහි සිරි න
ස ත ර තුණෑස් සුර අණ මතුරා දරි න
එ ත ර යව සබඳකාහඳ මෝදර න

34 සො ලලා ඩා යශෙනන දනාහට ලෙස පි දූ ව
අ ලලා පත අතින් දූමසත්වන දෙ දූ ව
කා ලලා වර වෙතෙහි පත්කල දින ර දූ ව
නී ලලා වට වනට සබඳිනි ගොස් ව දූ ව

35 නි සා එදින බලමින් එහි තුරෙක ඉ ද
ව සා නැවත දිනිසුරු එනකල පිබි ද
අ සා රව දරා තසිරස සවත ප ද
ප සා රකර ගුවන නැඟියාගත් සබ ද

36 ල කා අ ට යේ සිදුරදසෙන් තරනි න් ද
එ නු සැ ට යේ දකිමින් මෙහි නරනි න් ද
කා ළ සැ ට යේ සැදිසිටි කුළු පෙලකා න් ද
කා ල මැ ට යේ මෝදර දකු මිතුරි න් ද

37 රු දි රා පැහැති ජලතුළ දිසි ලවන්රු සා
ම දූ රා සියලු කවිලදවැනි තයනු අ සා
සොදුරා එසිරි තුටුකර බලමින් මනැ සා
ගැඹු රා කලින් ගොස් යලි ලූනාවම පිවි සා

38 ස ල් දෙ ල් දුටමුත් පසුනොව එකසිති න
මු ල් පු ල් කොංට සිදලියහැකි බල ව ද න
නි ල් හෙ ල් බටමෙන් නිති මද ගජ රද න
ග ල් මූ ල් ලට වැදසෙදයන් සකිසඳි න

39 ග ත් කුසයේ තමන් ගිනිනිවනා ලෙ ස ය
කෙ ත් අසකට පිවිස බුදිමින් කැන්ස ස ය
ප ත් ලෙස විනම් තකුලඹකර අබිල ස ය
සි ත් නොසකොට යතුරු කරනැඟි නුබ කු ස ය

---

33 අඟිබවනෙහි, උරහම සිරයෙහි; සතරතුණෑස්සුර, කතරගමදෙවියන්ගේ,

34 පතඅතින්, මාඝීයනමැති හස්තයෙන්; දුමසත්, වෘක්ෂනමැතිකුඩ, වනදෙදුව, ආරණ්‍යසුරදූතිකාව.

35 නිසා, රාත්‍රිය; සවත, කතරගමදෙවියන්.

36 සිදුරද; සමුද්‍රයනමැති රාජයා.

39 කැන්සසය, ශස්‍යමඤ්ජරීන්; තකුලඹ, තාගේ කුලාම්බිකාවක්.

40 කු රි රු පිසස් වැදම්හ් සිඳු කුසින්ගො ඩ
ස රු රු එමස් ගෙණ්වුත්කල ලෙසින් ගො ඩ
රු දි රෙ වි පස් යලිබඳුරත් කුසුම් ගො ඩ
ම් තු ර ත ඈ ස් යොමුකරබල උසන්ගො ඩ

41 වෙ ණු කි ර ඹා ඈලලූදසිරි කතුන් ලො ලේ
පු ලි නෙ ල ඹා තුලයෙහිමුතු ලෙසින් දි ලේ
එ ගි එ ල ඹා දනමන සහ තුටින්කෙ ළේ
සි රි න ර ඹා ය වසකි වැලිපටන්වි ලේ

42 තු මු ලේ මතග දූරුවන එයනු ල් ලේ ය
උ දු ලේ සරඟ පෙලලෙස නිවිදු ල් ලේ ය
එ වි ලේ නාවාලි නාම්නිසු ල් ලේ ය
සි ය ලේ සිරිනරඹකර සිතුලො ල් ලේ ය

43 ග ඥ ල් බත්ත ගිය සිදුකත ඇළුම්කො ට
සි ලි ල් වත්ත මිදුවේ කොත් කලූන්දු ට
එ ම ල් පෙත්ත මදහසයෙන් බැලූම් කො ට
කු හු ල් චිත්ත නොවවදු අම්බලන්තො ට

44 තු රු ම ලි ගි ලී සුවදට නෙණෙන සිහිලැ ලී
එ ගි තු ළ ගිලී නාපිරිසිදුව එමක ලී
ගොඩනැගයලි වැද දෑගැබට එගිදි ලී
නොවසිතුමැලී ගඟසිරි නරඹ මනකා ලී

45 ත ම න් සිරිපානමෙන් ලකගන ලත ර
ස ම න් කුලමුහුල විදහා කරසත ර
නො හිම් දිසි මෙවල ශියගං තෙරපත ර
එ සි න් එකෙක සිරිපැඩි දුටුහට නිත ර

ප්‍රභාර දුෂප පුෂපිතාලඞකාර ලතාදුමාදින් පුගමසනීරයෙහි ප්‍රතිභසිතවූ, තවද සෙවතවණීණ මුකතාකාර වාලුකසථලයෙන් මනොඥවූ ජලධාරා ප්‍රවාහඇති වලගිය ගංගානම් නදිතීරයාගේ වණීනා ප්‍රබනධයක් කෙරෙමි. මිතුර තාශ්‍රවණ ලඞකාර කර—

---

40 රුදිරෙවි, ලේවැනි; රත්කුසුම්, රතුමල්.

41 වෙණු, විශණු; කිරඹා, කිරිමුහුද; එලපුලින, සුදුවැලි, අඹාතුල, ජලයෙහි.

42 සරඟපෙල, මෘගපනතිය; සුල්ලේය, උසුලන්නාවු.

43 බත්ත, සවාමියා; සිලිල්වත්ත, ජලයනමැතිව සතුය.

46 නී හී ය න එ නා සතහට'දූරනින් සප ඝා
ච ලු ගො ඛතැ නා ඝීමට සිටිනුය එවෙ ත
අ ඹ දෙ ඹ ප නා අජ්ජුනදුම අතු අ ත
දි ගු ක ර ම් නා සිටිනුය දෙතෙරට සත ත

47 එ ගි පි පි ම ලි සි රේ ය තුරු සිරේ ය
ච න රොනුදකකෙ රේ ය සුදු කොරේ ය
සු ග දි න් එ පැ නී රේ ය නිරතුරේ ය
නොතලුමනුස කො රේ ය ලොබ කොරේ ය

48 එ ගි කෙ ළි නා ග නා ය වැනිග නා ය
උ ඹු කු රු ච ම පි නා ය මනපි නා ය
ච ත ස ර ද කි මි නා ය ලොබ මී නා ය
ත න නි ස රුන්පි නා ය පසු පි නා ය

49 මු තු සෙ පු ලි න දි ලි ය ජල දි ලී ය
එ ගි කෙ ළි සිව් මැ ලි ය නොව මැ ලී ය
මු හු ල ස ගි නි ක ලි ය බෝක ලී ය
සෙවෙලැටිමින්වෙ ළි ය නොවමැ ලී ය

50 නි නි සෙ න් සිලිල ගොසවන් මේ නද අයු රු
අ ස මි න් තුටුව රඟමින් නද දෙත මීයු රු
සො බ ම න් මෙවලගිය ගංතෙර යුරුසයු රු
සි රි ගි මි කොට කිහැකිවන නොද විදු කොයු රු

51 එ ත ර චම එගංඉවුරස ඉක්ම ඉ දේ
ප ත ර පෙමවඩා සිතුසැම දුක්ම සි දේ
නිත ර හැමසතන් රැකිසුර රුක්මලෙ දේ
කත ර ගම දෙවිදුහට ඉතවිටක්ම වැ දේ

52 එ ද ද කි මි නි පෙරදෙස නොයුත සිතමී නී
ඉ ඩ හ රි මි නි සිටිලෙස සැරුණී දිනමි ණී
එ ද ද කි මි නි සිතපෙම දියුණුකරමි නී
පි ය වි ද මි නි යවසකිගුවන සප්‍රැමි නී

---

46 අජ්ජුන, කුඹුක්.
47 සිරේය, මුදුනේ; සිරේය, ඉසිරීමෙන්; උදකකරේය, ජලයෙ.
48 නාගනාය, උරගනානාවන්; පිනාය, සතුටුව; පිනාය, පිනාය;
49 මුහුලස, කෙශකලාපය.
50 මේනද අයුරු, මෙඝනාදයමැනී.
52 දිනමිණී, සූය්‍යීයා.

53 නී ල මී න්   නීනී ඹරඳි සසකුරු කෙත්වි   වී ය
බ ල මි න්   නොම එලඹ එගිකර සිත් අ   පි ය
ස ල මි න්   තගෙ ෂුනිල පිය යහපත් සැ   ව් ය
ව ල වි න්   ගොස් දකුව සකි නිඹරුක්වැ   පි ය

54 ස  ද සෙමඳු ලා  උවනත ගහණරන්කු   සේ
හ  ද තන පි ලා  හසරණලියන මෙන්දි   සේ
ල  ද මෙම බලා  නෙතසිනු වඩවමින් ශතා   සේ
මැ ද ග ම බ ලා  යව මිතුරිඳුනි මන්ලෙ   සේ

55 එ ගි සි රි නා   ගජගිරිකුළු ෂු   ත් තේ ය
පැ න කෙළිනා   තැන තැන මිග රෙු   ත් තේ ය
දූ වූ හො තී නා   සිරිසර මෙපැවැ   ත් තේ ය
ව ද කෙ වෙනා   මනුසක් අකමැ   ත් තේ ය

56 සෙ සි පු ත් ව න්   මදමඟිසන් ගිජිඳු පෙ   ළ
ලි  සි ලෙ ක්න ම්   නැතිමය එගි කොබඳු කා   ල
එ  සි දෘ ක්මෙ න්   බිය නොමගෙණ දෙවිඳුබ   ල
ප  සිබොක්කෙන්   නොස් දූකගන් දෙබිජුකා   ල

57 නූ ල ප ව න්   සිසිවත කොදවන් දළි   නා
ඒ ඇ ර ප න්   සැරලිය රුසිරෙන් දිලෙ   නා
පෑ ස ර ව න්   යොවුනඹු දකිමින් ලොලි   නා
ඒසැණෙකින්   යව සකි කොහොලන් කාලි   නා

58 දූ හු ම ගා   ප න් න රසකා සිතු ලෙ   දි නා
ව ල මි ගා   පෙන්න කෙළිනා අනුබ   දි නා
මෙ ම ර ගා   ච න් න සිරිසිලුවන පෙ   දි නා
ම හ ලි ගා   තැන් න පසුකර සකිස   දි නා

59 නිතිනොහැකි ලි ය   සරඟුත් හොමෙගි සන්ව   ත
උ ද කෙ ගි ගි ලි ය   රුදුගිම්උන වෙමින් ග   ත
පොරඇනකෙ ළි ය   තැන තැන දිව අතින් අ   ත
ද කු ම ල එ ලි ය   සරසකි සහ තොසින් සි   ත

---

53 නිලමින්, කිරපක්‍ෂිවර්‍ණයෙන්; නිඹරුක්වැවිය, කොසඹගස්වැවිය
54 හසපිලා, හංසපැටවි.
56 සෙසි, ප්‍රකාරයෙන්; එසිදෘක්මෙන්, ඒකාරණව දැකීමෙන්.
57 පන්සැරලිය, රතිනම් දිව්‍යාඞ්ගනාව.
58 පන්නරස, පතුරසයන්.

60 නෑ ර එ ක් ක  ඇවිදින් පැරි පෙල නිබ  ද
ගෝ ර උ ක් ක  තලම්න් සිරිනුය එබ  ද
ඌරුරෙ ත් ත  දුටුමුත් සිත බියනොවැ  ද
ආ ර බො ක් ක  පසුකර යාගත් සබ  ද

61 කු ස ල්  කෙත රකින පමණට එගි ස  ත නා
වි ස ල්  නොව ස්‍ුසැදි මඩමක් ඇත එ  ත නා
ඩසෙ ල්  ලුනසඳ ගතගිම් වැද ප  ත නා
සසොල්  පෙව් කලක් එගිසිට යත් සි  ත නා

62 නි ති  ය න  දනගෙ අසබඳු ගැන්මට නෑ  ර
මැ ති  නරවිරු වෙතින් චුත්සිටි මනුද  ර
රු ති  වන අයපලවෙත සිට අවිදු  ර
ඇ ති  තගෙ තුනුගිමන් මදකල් කර පෑ  ර

63 කිඹු ල  ගෝර ඇතිසන්ද නොව ප  වූ ව
තුමූ ල  දි  ර කඳසුරඅණ ගෙණ තු  වූ ව
සි ලි ල  නෑ ර සනාසා ගිම් කර ප  වූ ව
මලල  ආ  ර පසුකර යාගත් ඉ  වූ ව

64 සුර ගු රු  නැණින් රුසිරෙන් රතිපාල ධු  ත
මැතිසු රු  එවෙත සිටිවනලෙස ආල සි  ත
සු මි සු රු  නදිනිගිලි සපැමිණි නිල ප  ත
මඹි තු රු  ගොසින්වදු මහ ලේවාය වෙ  ත

65 එ සි නි ක්  බිති නොප සපැමිණ යන ව  ලි න
දෙ සිරුක්  පති ඒදක දෙනුමෙන් ති  ලි න
ලිසිලෙක්  නැති තුරුනැමුනේ පල බ  රි න
එ සි සි ත්  රුති ලෙස වලඳ යව ලො  ලි න

66 ය ලි ප ත්  වි ට සියතගෙ එම අරණ  ව සා
පි ළි වි ත්  තු ට ත හමන තොරතුරු නො  ව සා
ක ලි සි ත්  ම ට ඉත අයදුමකිනි ප  ව සා
වැ ලි ග ත්  ත ට විසුමට යාගත් ස  ව සා

---

61 ඩසෙල්ලුන, ඩහදිය සෙලවුනාවු; සසොල්පෙවුකලක්, සුළුපමා ත්‍රකාලයක්,සිතනා, ඉෂ්ටමිත්‍රය.

62 පඩුවකර, අඩුකර; ඉටුම, මිත්‍රය.

64 රතිපාල, අනඩහයා; නීලපත, අහස.

65 වලින, වනයෙන්; ලිසීලෙක්නැති, අඩුනැත්තාවූ.

66 සිය, සඛියයන්; ඉත, මිත්‍රයා.

67 එ ක ල  අඹසකර ගියවෙතඹ අත් ගි  ර
ල ක ල  විලඹු ඒදුවු මැලසි සිත් ක  ර
හැකි ල  මුවතඹර පිය උපුල නෙත් ත  ර
අ කු ල  වම්න් ලු වලබමර මුත් හ  ර

68 ම ද ව් ග සා  තුරු අසෙ සා  කුමුදු රැ  සා
ගෙණසරසා  ය හ න හ සා  සිතු විල  සා
නිස යු රු සා  අ ම ප ත සා  විඳින ලෙ  සා
සැර සි නි සා  තු වු ව නි සා  ගන මෙලෙ  සා

69 කුමුදු ද ලේ  පො බ ද ව ලේ  කර විපු  ලේ
පෙරසසිලේ  දෑරි නෙ ක ලේ  වැද සස  ලේ
එනිසක ලේ  හැ ඳි සු නි ලේ  වත හැකි  ලේ
කිසිඅ වූ ලේ  නොවම්ලොලේ  අවල කො  ලේ

70 මෙම ලෙසි නා  මෙමකරු ණා  පැමිණි තැ  නා
තු රු මු දු නා  වෙතපැමි ණා  සිතැඟි ව  නා
සි කි ය හ නා  සු ර ස ර ණා  ගෙණබැති  නා
වි ල ස ම නා  නිදසොබ නා  සකිසඳි  නා

71 යලි දිනි දු  පෙර ඹ බැ දු  දදවෙලි  දු
කිරණරු දු  කා ග වි හි දු  රණට සි  දු
එස ද ඉ දු  ස හ නි ස දු  විය තුරු  දු
වගු ලකදු  ලැ ලි ය බ දු  එපිනි බි  දු

72 සර එස රා  නෙ තිදු ව රා  හැර එව  රා
මුව තඹ රා  තු වු අ නු රා  පොබය කා  රා
හලබම රා  එ මු තු හ රා  නැවතස  රා
දිවස ක රා  දැ කා එ යු රා  කරතිනු  රා

---

67 අත්ගිරඹවෙත, අස්තපර්වතය නමැති ස්ත්‍රියකෙරෙහි; විලඹු, විල්න මැති ස්ත්‍රියෝ; වල ලු, බැඳදට දැමුහ.

68 මදව්ගසා, විස්තරණයෙහි; අහසායහන, ආකාශය නමැති යහනාව; නිසයුරු සා, චන්ද්‍රයාසමග; නිසාහන, රාත්‍රිය නමැති ස්ත්‍රිය.

69 පෙරසසිලේ, පූර්වපර්වතය; සසලේ, චන්ද්‍රයා, එනිසකලේ, රාත්‍රිය නමැති ස්ත්‍රි,

70 සිකියහනාපුර, කන්දැස්වාමි.

71 පෙරඹ, පූර්වාම්බරය; රණට, යුධයට; ඉඳු, චන්ද්‍රයා; නිසඳු, රාත්‍රිය නමැති ස්ත්‍රිය; තුරුදුවිය, වෙන්විය,

72 සරඑසරා, විල්නමැති ස්ත්‍රිහු; නෙතිදුවරා, ඇස්නමැති නිල්මානෙල්මල්; සරා, සරසා; තුරාකරති, අනුරාගකරන්ය,

73 යලිමෙමෙනේ දූ ක ක රු ණේ එමිසඳී නේ.
පි ළි ස ර ණේ ස ව ති ඳු නේ ගෙණාවුදු නේ
දි ලි ය මි නේ නැති ගු ප නේ පැහැනදි නේ
මැලිනොමිනේ ය ව ර නි නේ සකිසඳි නේ

74 තු රු පෙ ල සෙ ව නැ ලල සැදි දවලෙව් වැ ලල
කෙළ කෙළ මිග තො ලල දි කති ලිය ප ලල
සි රි ස ර මෙ සි ය ලල දූත සිතු කර ලො ලල
ස බ දි නි එ ය ද ලල පසුකර නොව මැ ලල

75 සැ ථි ය ස රා සඳවත ඉදුම්ණි ඇ සි නා
තැ ථි ය පු රා රණ තන යුවලෙව් දී සි නා
ග ථි ය කා රා අඟනන් විසු මෙම ලෙ සි නා
ච ථි ය ච රා එලඹි යව සඟ තො සි නා

76 ත ම න බැ ඳි ය න ප ත දී යු ග ප සි නා
සි ගි නි ගෙ දි තු රු ලෙ ල දී න ල හ ම නා
එ ගි නො රැ ඳි වෙ ල වි ලෙ දී ගො ස් තු ථි නා
ඔ ය කි රි දි වෙ තෙ ගි රැ දි හ රු ගි ම නා.

77 පු ලි නයෙන් දිසි ජලතුළ බසිමි න් ද
ගි ලී නා තමන් තුනු පිරිසිදු මෙ න් ද
වෙ ළි එතර සිට දුකු මුලු පුලමි න් ද
ය ලී නමඳු තෙම්ටක් කද කුමරි න් ද

78 පෙණෙනා සෙයින් තිස්සෙව් වෙහෙර නෙත්පු රා
ල බ නා නිසත් මනු මොක් සැපත සිත් පු රා
සො බ නා එනුප හිමි දෙස අවනතත් කා රා
ගො සි නා වදු සබැඳ විල අසට සිත්තා රා

79 පැහැපත ලක ල් උවනත නෙත් මුහුල් සි ත
සි ය ප ත උ පුල් සෙවෙලඳ මුදු සිලිල් යු ත
හ ර මු තු උ දුල් බිඟුලිහිණින් මෙවුල් ල ත
සි රි ග න සි ය ල් වර ගන කුශෙ එවිල් කා ත

---

73 සවතිඳුනේ, කඳුළුවමින්ගේ; අරණේනේ, වනයෙන්.

74 දවලෙවුවැලල, සුදුවැල්ලෙහි; මිග, මුවෝ; ලියපලල, ලතාඑලලවයන්.

75 සරාසඳ, සරත්චන්ද්‍රයා; දිසින, බබලන; ගථියකාරාඅඟනන්, කවිකාර ස්ත්‍රීන්.

76 පතදි, මාර්ගයේදී.

77 පුලිනයෙන්, වැල්ලෙන්; වෙලී, විසලී.

78 තිස්සෙව් වෙහෙර, තිස්සමහාවිහාරය; එනුපහිමි, ඒ උපාසකවාමීන්;

80 ඹ ෙද් හළ දිතන් කඳ සුර ගිම් තු තු ර
වැ ෙද් විසූ සයිල ලෙන පෙණෙනුය උ තු ර
සෙ ෙද් කළ සැපත වෙයි සිඳ රෝග තු ර
නා ෙද් දිසුණු කර එදෙසත් වැඳ මි තු ර

81 දු ර ත් තු සෙ යි න් එහි පිහිටුනු දුම් ද
ති ර ත් නය උදෙසමි න් තම සිතු පැහැ ද
සි ර ත් බැඳ එ හි ම තු න් විටකම නැම ද
සු ර ත් දෙක දකුව ඉ න් ගිය කල සබ ද

82 ලෙ ස ඉ න් ද්‍ර ගුණ නැණ සුර ගුරු අසෙ ස
ද න රු න් ද්‍ර නිබඳම විලසින් සතො ස
වැ ව බැ න් දු මේ නම් සිරි දුරු වෙසෙ ස
අපො රෙ න් දු නොවයව විසුමට සව ස

83 ය නේ සඳ තපන වෙත වර දික් ඇ සි න
තැ නේ එකම ලූමෙන් දහසක් රු සි න
ගු ණේ දුරු සබඳ බල පැලදික් ගි සි න
පෙණේ රිවි මඬල රත්යවටක් ලෙ සි න

84 එ වි ග ස එහි පිහිටි නිසි තුරකට එ ල ඹ
බ ර ඇ ස සරණ ගෙණ නිදමින් නොවි කැ ල ඹ
එනු ලෙ ස බලා සරසිය පුරුව කු ල ඹ
ය න ලෙ ස ගමන සකි සඳ එලඹෙව නි ල ඹ

85 ඇ සා බර අමර සිළු එපිල සක් ල ග
ව සා පැමිණෙණ වර එන මිපුරු නොක් ව ග
අ සා ඔවුනතින් ලප් පෙරටු දික් ම ග
ප සා ර කර ගොස් වදු වෙත මැණික් ග ග

---

80 දිතන්, අසුරයන්ගේ; තුතුර, චතුරවු; රොගතුර, රෝගානාතුරයන්;

81 ද්‍රුමිඳ, බෝධිද්‍රැමය; තිරත්නය, තුන්සරණ;

82 ඉන්ද්‍ර, චන්ද්‍රයා; සුරගුරු, වෘහස්පති;

83 වරදික් ඇසින, අපර පර්වත නමැති සත්‍රිය, පැලදික්, බස්නාහිර; රත්යවට, රක්තයවට;

84 බර ඇස, සකන්ද කුමාරයා; සර සිය, සූයර්‍ය; පුරුව කුලඹ, පූර්ව පර්වත නැමති සත්‍රි; නිලඹ, නීල ආකාශය;

85 ඇසාබර, සකන්ද කුමාරයා; එපිලසක්ලග, මයුර රාජයා ගෙනගෙණි; ලප්, සලකුණු; පසාරකර, පසන ප්‍රහාරණයකර-

86 අ ය දූ මී ලෙ සි න් දරමින් මෙමගෙ තීරතු ර
ගෙ ව මි න් නො ලං පැමුණුනුසෙපිනි මගතු ර
තු නු ව න් ගි ම න් සිදෙනානෙක්ම මතිතු ර
බ ල මි න් නු ව න් තුටුකර එගඟ විසිතු ර

87 තෙරතෙර සු සැ දි තු ර තු ර කුමුදු සිර සි ර
ව ර ව ර ල ව ති හැ ර හැ ර කුමුදු පර ප ර
ත ර ත ර ගු ද ක ක ර ක ර සුගඳ තිර ති ර
ස ර ස ර කෙළිති තෙරතෙර කොමල කර ක ර

88 බැ ලි බැ ලි විටෙගි එදනත් එගඟ ඇලි ඇ ලී
වැ ලි වැ ලි තෙලෙක මුතුපුරු පෙණෙන දිලි දි ලී
ර ලි ර ලි තේ යතුරු පල නැවිනි ගිලි ගි ලී
සැ ලි සැ ලි කම්න් මින් කැල කෙළිති පිලි පි ලී

89 ගො ස ග න ව න් ව න් ගඟජල තු ලේ තු ලේ
කෙ ළි න ස ර න් ර න් පැ සෙ වි දු ලේ දු ලේ
එ ම දූ කු මෙ න් මෙ න් තු වූ සි කි පි ලේ පි ලේ
ලෙ සි නි ප ස න් ස න් දෙති ඉඳු කු ළේ කු ළේ

90 උ ව න් ස ස තුමුසු සඳ දෙතන හස සු රු
ලි ය න් බැස කෙළින නිති අමර සර සු රු
ගු ව න් කු ස නදිය ඉන් එගඟ විය සු රු
මු වෙ න් ය ස කෙලෙස මම වණම් ඇති සු රු

91 හැ ර රු දු ගිමන සනසා ජල එගඟ වැ දෙ
පි රි සි දු වෙමින් තමසිතු වඩවමින් න දෙ
සු ර නි දු පුරවරෙසෙ යස සිරි සිළු නොම දෙ
ප ර සි දු කතරගම වෙත එලඹෙව සබ දෙ

**තවද** සකලශ්‍රීන් භරිත විශුඩ විමලාති ප්‍රශන්ත යෞවන භාව ඇති සත්‍රී ලඞකාඞගනා මස්තකෙක කිරීටායමානවූ කදිර ග්‍රාම නම් පුරප්‍රවරයාගේ විසිතුරු කථා ප්‍රබනධයක් කෙරෙම්. සබඳ තාත් මෙනෙහි කර.

---

87 වර වර, දිනෙත් දිනු, තර, මහත්වූ; තරඟ, රැල; උදක, ජලය;
89 සරන්, සත්‍රීන්; සිකිපිලේ, මයුර සමූහයා;-
90 අමර සර සුරු, දිව්‍ය සත්‍රීන්මෙන්; ගුවන් කුසනදිය, ආකාස ගංගාව,
91 සනසා, නහා.

92 එ ක වි ට සත් සපුර ගොස වෙද එහි නා ද
වි ල ස ට ඇසෙයි පවතින පසතුරු නා ද
ලි ය සි ට වේ දෙපස සි සුමිහිරි නා ද
ඇ සු වි ට සකි සඳිනි කාසිත් නොපි නා ද

93 ඳි ව ග න නුබරගන මෙන් මිණි අතිත් ගෙ ණේ
බ ද ර ණ යට අගෙහි දද පෙල තිහින් වැ නේ
ස ව ද න අමර හිමිසඳ කළ බැහින් මෙ නේ
සි හ සු න සහ මැදුර දෙව් දකුණතින් පෙ ණේ

94 දෙ වි දු බඹ අසුර නර සකල උරි දු න
සු සැ දු සරණ කමලෙව් යුගලඹ මු දු න
මූ නි දු දෘ පිහිටි නෙද යසස විහි දු න
ප සි දු කිරි වෙහෙර බල උතුර සුසැ දු න

95 තැ න් තැන දිලෙන රන්රජ තෙව් තොරණ ර ඹ
බ න් මිණි කිරණයෙන් එකලූවේ පු ර ඹ
න න් රණයටග ලෙල දද මෙන සුර ස ර ඹ
ම න් මෙන එපුර සිරි මේ හැම සකි න ර ඹ

96 ස ව නි දු විසූ මැදුර සොම් මඬල සි රි ග තී
එ හි සි දු සෙන් අවට උළුපෙලෙහි සි රි ග තී
පි රි සි දු කඳිර පුරවර නුහුනු සි රි ග තී
එ යි නු දු සම කරන නුබතෙලෙහි සි රි ග තී

97 නි ම ල කොද සුගද ගෙණ එන හසුර මි ණි
අ නි ල බෙලෙන් නදකරවන කිකිණි මි ණි
ස ස ල දද පෙලෙන් ගැවසී එසිටි මි ණි
ල ක ල එපුර වැලකිය කිරණ නුබ මි ණි

---

93 නුබ, ආකාශය; රණයට අගෙහි, ස්වර්ණයෂ්ටියාග්‍රයෙහි; සවදන අමර් හිමිසඳ; කාඤ්සවාමින්.

94 උරිඳුන, නාගයන්; දෘ, ධාතු.

95 රජතෙව්, රිදී; බන්, බඳනලද; සුර සරඹ, දෙවියන්ගේ නෘත්‍යය; නරඹ, බලව,

96 සොම්මඬල, චන්ද්‍රමණ්ඩලය; උළු, තාරකා; නුහුනු, ඌනත්වයක් නැති; නුබතෙලෙහි, ආකාශයෙහි.

97 අනිල, වාතය; නුබමිණි, සූර්‍ය්‍යා.

98 තු බ මි ණී අවර වනකල කුමුදු මූනු මි ණී
මූ නු මි ණී කොද හැකිලෙයි උදය වර මි ණී
ව ර මි ණී එපිරි සිප්සෙන් එපුර සපැ මි ණී
ස පැ මි ණී බැව් දිවා රැ දූනගණිනි මි ණී

99 දි ලි ක ද කුමර පුරවර සිරිසර සම ත
හෙ ලි ව ද ගිශෙන් පවසා නර අමර ස ත
මැ ලි ස ද තව සිපිනු බැව් දැක සහස නෙ ත
වි ළි වැ ද ගොස් ඩසන මෙනී දූත් සුනෙර ම ත

100 අ ත ුව කොතැහි මෙසුරිඳු පුරවරෙශි ගු න
ය ස ට අලකාපුර සිරි සරි නොවනු දූ න
නොසි ට දනිඳු තුරු තම පුරවර රැගෙ ණ
ම ත ට කෙලෙසකුළ දූත් ගියවෙනි විළි න

101 අ සු ර ර දු න් වෙත උ ර ණ ය වෙමි න් ම න
එ සු ර නි දු න් සැ ර සි ක ර ණ මෙ න් ර ණ
අ ම ර ර දු න් පැ ර දි ය න බි යෙ න් ම න
එ පු ර ල දු න් වි ත් සි ටි දි ව හ න න් මෙ න

102 කුවෙ ර හිමි අලකනම් පුර යසස ලො ලී
අමර පුර දිනූ නෙක යසස සිරි සි ලී
එ පු ර යස කියනු සවනිදුම මිස ය ලී
කා ව ර විදුවරෙක් පවසාද නොපැකි ලී

103 දි ලෙ න ර සු දු ලා තොරණෙව් කද ලී ය
සැ දු නී එ හි තු ලා පිරිගට සිය ලී ය
මෙ සි රි ස ර බ ලා මන තුටිනි පි ලී ය
ස බ ද ය ව බ ලා මහ පනිනිපි ලී ය

104 ගු ණ රැ දි යස සහස සරදෙව් තරිඳු ර ග
එ ඹ රැ දි වම විසූ පෙර මහ පිණැති අ ග
ප ව ර දි කරණ මැතිසුරු කළ වීදි ම ග
නි ව රැ දි ගොසින් වඩු සකි කිරි වෙහෙර ල ග

---

98 මූතුමිනි, ප්‍රබොධවූ, මිනී, මෙසින්.
99 සමත, සියල්ල; සහසනෙත, ශක්‍රයා.
100 අලකපුර, අලකමන්‍ද, නම් පුරය; කෙලෙසකුළ, කෛලාශ පර්වතය
102 කුවෙරහිමි, වෛශ්‍රවණ, විදුවරෙක්, පණ්ඩිතයෙක්.
103 ගට, කළ; මහපතින්, මහාමාශියෙන්.

105 ම තූ ස ග මො ක් සැප ලබනා විලස ස ර
මො කැ දූ රු දූ ක් සලකා සිහිනෙන් නොහැ ර
එ හි තෙ වි ට ක් පැදකුණුකොට නමා සි ර
ය ලි බ ර ස ක් සූරහල වෙත යව මිතු ර

106 ති නෙ ත් දෙව් සමය ඇඳිලි කර බැ ති න
ම හ ත් දෙමළ ගොසයෙන් අයදි නි ති න
ය ලි ත් එගුරුවන් මඩමඳ දූකනෙ ති න
ස ව ත් මැදුර පසෙකින් යව තුටු සි ති න

107 ඊ ත ර නොවන සුරබඹසුර නර ළු ර ණ
ප ත ර පෙමින් අවනත කල යුග ස ර ණ
ස ත ර වැඩ සිටිය මිණි වෙහෙරක පො ර ණ
මි තූ ර එහි එළඹ පෙරටුව නොව ළු ර ණ

108 දූ මි වූ සත ගිමන පවහළ මැදුරු මි ණේ
පි ශි වූ වන නැමඳි සතගෙණ පුර නිව ණේ
ඈ ස වූ තුරු කුලෙව් ගන සතනින් නිව නේ
ස නි වූ හන්ව මතු සැපවිඳු සකි සඳි නේ

109 බ ව න මි වුහුද ගිය නොමඳි ලෙව් සත න
ස ද හ මි නැවිඳු ගෙණගොස් ලූ පුර නිව ණ
දි ව ම න් මුනිඳු දුටුමෙන් කර ඔහු බැති න
ස තො සි න් නමඳු පිළිමය ගෙඩි වැඩ සිටි න

110 තෙ ද න රැසින් බිඳලොව දුක් අඳුරු ක ද
ස ද න සැපත් අයදින සතහට නොම ද
ර ද න දිවඹ දිවසෙන් සහ කුමරු ක ද
න ද න දෙව් රජ නිවෙසට වදූ සබ ද

111 දූ මි දෙ න එම දෙව්රජ නිවෙසෙහි අනු රේ
ච න් ද න නුවර කළුවැල් කපුරෙන් නිත රේ
සි ත් ද න වී පැවති සිතුරෝ දුක් අනු රේ
න න් ද න වෙසි සිත එහි දුටුවිට මිතු රේ

---

105 සිර, හිස; බරසක්සුරහල, කඤ්ඤස්වාමින්ගේ ශාලාව.
106 තිනෙත්දෙව්, ඊශ්වරයා.
109 දිවමන්මුනිඳු, දීපඞ්කර සර්වඥයන්වහන්සේ.
111 නන්දන වෙසි, සතුටුවෙයි.

112 ර ති සු රු   රුවින් නැණයෙන් සුරගුරු සේ   මා
නොමසුරු   වම දෙවන තිළිනෙන් සුරදූ   මා
එ ඇ සු රු   උබ බෙත්ම අදිකරණෙව් නා   මා
මැ ති සු රු   බල සිටින සුර කුමරුන් සේ   මා

113 දූ   සු   ර   වෙනු නිගා කල රුසිරැති සියැ   ගා
නු පු   ර   පුන දගා ලෙලවා එමන ර   ගා
සේ ග ර   රණ පුගා පුගපත හෙලන න   ගා
මේ පු ර   ලිය ලගා තුටුකර සබඳ ම   ගා

114 එ ගි ප ව ති නා   සිරිසර මේ නම් අසු   රු
කර වෙනවෙ නා   ඇතිලෙස කීමට සොදු   රු
සි කි වා හ නා   ඇරු සම්මුක සුරිදු සු   රු
ය ලි අ න ත නා   මිස මෙගි පවසගි කවු   රු

115 එ බැ මි න්   එගි පැවති මේ විසිතුරු සිය   ලු
ද කි ම් න්   අවසානයෙහි තුටුසිතිනි සි   ලු
සි හ සු න්   වැඩගිඳින මිණිබරණින් ලකු   ලු
සොබම න්   සවන් සුරගිම් සඳ දකු යහ   ලු

**තවද** සමසත සත්ව ලොක රොගදුක්ඛ අන්ධකාර විධ්වංශනය පහන්කරවූද, සකලසත්ව චිත්තාභිමතාපී සිඩියට සුරදෑම හදු ඝට චින්තාමාණික්‍යය මානවූද කාදිරග්‍රාම නම් දෙවස්වාමීන් වහන්සේගේ නිජ දෙහවර්ණ ප්‍රබන්ධයක් කෙරෙම් මිතුර ඒද නාත් ශ්‍රවණයකර:—

116 නො ගි ම්   තෙදැති එගිම්ගෙ සසිරස තෙවු   න
රු ව න්   කිරුළු යස රුස් විගිදි දිලෙ   න
ප ස න්   ගන කනක කුළු සයකට පැම්   ණ
කෙ ළි න්   නම් කෙසර රණ සදෙනෙක් එමෙ   න

117 ප සි දූ   සවතිදූගෙ නිති හෙබූ නලල   ස ය
හ රි දූ   තෙන අඩක් ගල රිවි මඬල   ස ය
එ බ දූ   ගන කනක පට සයක විල   ස ය
වි ගි දූ   කිරණ සෙව්දුල් තොස් එම ලෙ   ස ය

---

112 රතිසුරු, අනඩගයා; සුරදුම්, දිව්‍ය ව්‍යඤ්ජය.
113 වෙනුසුරදූ, ශ්‍රීකාන්තාව.
116 සසිරස, ශිස්හයේ; කනක, රත්රන්.
117 හරිදූතෙන, රාහු.

118 ප සි දු සවනිඳුගෙ සකපිය වීට ගෙල නා
සි නී දු බැම සගල පෙල කළ සඟ ලෙලෙ නා
නෙති දු වරත් දකිමින් පුබුදුව දිලෙ නා
එ සී දු ලොබින් බිඟු පිළිවිත් වෙත කෙලෙ නා

119 එ සූ රි දු නේ පල කළ දිගත තෙද සි නේ
බ ර ස ව ණේ දිලියෙන තෝඹු කෙලෙ සි නේ
වි සූ ව ද නේ සරසවි බලන වෙසෙ සි නේ
යෙ දු රු ව නේ කැඩපත් දෙලොස විල සි නේ

120 සො බ ම න් එහිමි රණකුසුවන් ගනන ස ය
ව ද න ම් බුජ සයට ලොබවත් රණ ග ස ය
කි වී දු න් වසින් යෙදුවත් මේ සම බ ස ය
මූ නි දු න් හට සමකළ නිවටුන් ලෙ ස ය

121 තෙ ද ගි න් දනන් රෝදුක් සිත දුරහරි ණා
ම හ සෙ න් දේව ගිම්හුගෙ සවදන දිලෙ නා
නො ව මි න් අඩු තිබෙන සැමදින එකලෙසි නා
ල ප සු න් සොම් මඬලක් ඇත්නම් එමෙ නා

122 වැද පුද කො ට සිරින දනහට ලොව සිය ලී
සොඳ සැපත ට සොදවන තෙදැති මනකා ලී
ම ද හ ස වි ට එසුරිඳු මුව සය උදු ලී
ර ද දි නි දු ට කොකනද සයෙක සිරි සි ලී

123 අ නෙ ක් තෙඳිනුදුල හිම්දර අඩය රි ය
නො දි ක් වම එදරදල වසනෙගි සි රි ය
අ ඩ ක් සුරත් වෙලකින් වසමින් සි රි ය
පෙ ල ක් සඳහු දිලිහෙත් නම් එව සැ රි ය

124 ම හ ත් තෙද යසස නාබරණින් තෙවු නා
ස ව ත් සුරනිඳුගෙ ගෙල සශ නිති දිලෙ නා
එ කා ත් කොට පිහිටුවන ලද ගණ රණ නා
ම හ ත් වැම් සයක සිරි ඉසිලිය නිති නා

---

118 සකපිය, ඇස්පිහාවු.
119 බරසවණේ, කන්දෙළවස්; වදනේ, මුහුනේ.
120 වදනම්බුජ, මුහුන නැමති පදමය.
122 කොකනද, රත්පියුම්.

125 දි රි න ර   නෙදූනි කදසුරනිදුගෙ පැහැදි   ලී
ම න හ ර   උරතලා යුග සිනිඳු හැම කා   ලී
සි රි ස ර   සතත විසුමට නොකර සිතුමැ   ලී
ප ළ ක ර   තුඹු දෙරුවන් ඈදෙක සිරිසි   ලී

126 ර තැ ගි ලි   නැටි ලපළුපත් ලෙව් නක කුවු   දූ
පැ හැ දි ලි   මිණි බරණ බිඟු පල සිරිනි රැ   දූ
ම න ක ලි   එගිම් සඳ හුගෙ බර පන පයි   දූ
සි රි සි ලි   සුරතුරෙක අතු දෙලොසෙක එයි   දූ

127 එ බ ර ඈ සා   සුරවිරු දර හේම ගෙ   ට
සැ ඳු ම් ල සා   නැබසර දක පේම කො   ට
එබ් හු රැ සා   එනමෙන් සුසැදිම ව   ට
දි ලි නිව සා   රෙද එගිම්ගෙ සැමවි   ට

128 අ ලු ක ර   නෙදරැසින් ගල ලෙව් දුක් අඳු   රු
ගැ ම ව ර   සතන් රැකි සම්මුක එසුරවි   රු
ම න හ ර   පිටු තලා නිති බබලන සොඳු   රු
පැහැ ස ර   රුවන් මයවු පොහො රුවක යු   රු

129 ප ද සෙ ව නේ   වන දන දුක දුර සිය   ල
නි ම ව මි නේ   වැඩලුන් යහන සිකිපි   ල
එ සු රි දු නේ   මනහරවන් පුළුළුකු   ල
නිතිගොබ නේ   මයලෙස රිසසක් උදු   ල

130 බ ර නු ව නි න්   යුත් එගිම්ගෙ පරසි   ඳ් ද
පිරු ණු බෙලෙ න්   පුවලෙව් වටොරට සු   ඳ් ද
ත රු ණු රු ව න්   රඹ පැල යුවලෙක් ඈ   ඳ් ද
කාරු ණු එ මෙ න්   පැවසුව මුත් සමවෙ   ඳ් ද

---

126 බරපන, අත්දොළස.

127 හේම, රත්රන්.

129 රියසක්, රථචක්‍ර.

130 බරනුවනින්, ඇස්දොළොසින්.

131 ප ස න්  සුරනිඳුගෙ නිති දුරු වන අ  පි ය
නි නි න්  දිලෙන කොණ්ඩා ගුවලෙහි සැ  පි ය
රු ව න්  තැඹිලිමල් ගුවලෙක් එන අ  පි ය
නොමින්  විසිර සිටියොත් මදකට ව  පි ය

132 දි ර ත ර  එගිම් කෙණ්ඩා යුවලෙව් මුලි  හ
එ ස ත ර  අරක් වට දිලිහෙන නිසිලෙසි  න
නොවිසිර  රන්තැඹිලි මල් ගුවලෙක මුදු  න
එ ස ත ර  ලතැඹිලිය පලදිලි නම් එමෙ  න

133 න ලි ඳු  දඟ අකකි වට කෙම්පෙනහි  ලි ය
නොම ඳු  වැදි සත්ව බිඟු නක රොත් ක  ලි ය
ප සි ඳු  සය වදන් සුරිඳුගෙ පැහැදි  ලි ය
එ සි ඳු  යුග පත්ල දෙපිළුම් සිරිසි  ලි ය

134 තෙ ද නි න් දි නි ඳු  බෙ ල යෙ න්  දිනුකුළු මදු  රු
ය ස සි න් උ ලි ඳු  නැ ණ යෙ න්  යුත් සත් සපු  රු
ස මු වෙ න් ප සි ඳු  සො බ ම න්  එසුරිඳු රුසි  රු
කි ය මි න් කෙ බ ඳු  ප බු ව න්  නිමවේද සු  රු

135 ප ද අ ම්  බුජ එගිම් තසිරස සිට පැල  ද
වෙ හෙ සු න්  නිවා සිහිකරුවන් කර එස  ද
පැ ව තු ම්  බලා අදහස් උදහස් දෙක  ද
ප සෙ කි න්  සිට තනිය වග සැල කර සබ  ද

136 පු රු  තෙදින් බබලන යසසට නොම  ද
ද රු  යලිත් සගසිරි අදිකව පබ  ද
චි රු  ජිත මහත් සතහට පා නොවැ  ද
තිරු  කල් පවතු සම්මුක සුරිඳු ස  ද

137 තෙ ද ගි න් දි ලි ය මි න්  දින සැම එකලෙ  ද
ද ර මි න් කුළු ඤු ම න්  නොනාසම හැම ස  ද
බ ල මි න් ලො ව ස සු න්  බුවිපාල රැකිසො  ද
සො බ ම න්  කඳ කුමරු නා ම්  දේව ගිම් ස  ද

---

133 නක, නියපොතු; යුගපත්ල, පතුල්දෙක.

134 මදුරුකුළ, මඤ්ජරපජිතය. උලිඳු, වඤ්ඤයා; සමුවෙන්, මුහුණුස
ඕන්; සුරු, සමඬී.

138 ඔ බ ප ත නා කාරුණෙක් ඇද්ද සිතුලෙ ස
එ සි දූ ව නා සඳහා හිත්ව නොවල ස
සි තු කු එ ණා කරමින් නොවන උදහ ස
ඈ ශූ ව ම නා මය ජිම් මදකල් මබ ස

139 මො කැ දූ රු අප මුනිඳු සත වෙත කරකුළු ණ
සු ම දූ රු බසින් වදහල දම් කද පොර ණ
පි වි තු රු සිහලකරින් ලියමින් බැති න
නි ර තු රු තිය සරණ කිරුලෙව් ලූ මුදු න

140 ප ම ණ නුගණිත සත් සමුදුර කිමි ද
දෙ ව න සුබ මොහොත් මිණි දනාහට නොම ද
නා ද න "දෛවඥ" කුලවන පෙතෙගි මෑ ද
දි ලෙ න නැණ තුරත් ගෙන් නිසි තුමරකා ලෙ ද

141 දූ ජ් ජ න කම් ලිහිල් කර දත්තෙත් ම තු රු
ස ජ් ජ න බවට යෙදෙමින් වසන නිල තු රු
ග ජ් ජ න කුළුණු ගුණ දූරු සිතෙගි පිපි තු රු
ස ජ් ජ න නමින් ප්‍රතුවූ අයෙකි මම් තු රු

142 වා ත රෝග ඔහුගේ සියොලඟ විගි දී
ගා ත වල දෙයටිපලු සම්ගුළුම සෑ දී
නී ත කුටිරු මේ මේ රෝගෙන් ම සෑ දී
කී ත නිසරු විසරු තද වෙහෙස වි දී

143 ත ද බ ල රෝගපත් උගෙ එවෙනි සියග ත
පෙද නි ල වත් වෙලසිද ලමිනි නොනැව ත
තෙ ද බ ල මහිම යසසින් ඔබගෙ බරනෙ ත
සි දු කා ළු මැනවි පවතින උසිත අබිම ත

144 ව ගා ක ර ව මිත්මතු අතුරක් නොව නා
ල ගා ක ර සියත් සහ ඉත මිතුරු ද නා
නී ගා ක ර සිටිය රිපු ඔද සිඳ ලමි නා
දි ගා ක ර ඔහුට ජයදී සැම දෙයි නා

145 රු දැ සහ සත්දිවල සැදි සියලු ලෙ ඩ
සි දැ හැරලමින් දී ඔහුට කට හ ඩ
යොදැ එවූ හසුන සහ මේ පඩුරු දි ඩ
නා දැ සිතින් පිළිගත මැනවි නනා ස ඩ

---

139 සිහලකරින්, සිංහල අකුරෙන්; තිසරණ, තුන්සරණය.

143 බරනෙත, කන්‍දැසවාමිය; අබිමත, අභිමතාර්ථය.

145 නනාසඩ, කන්‍දැසවාමී.

146 අ ස්  ස රශදප ළ මූකොට ඔහු ලොබ සත  ර
ද ස්  ස වන වි ල ස යලි නැණ දි පත  ර
සි ස්  ස පූ ග ල යොත් සතරට කර නැතු  ර
ර ස්  ස කා ළු මැනවි නොවකිකාලත් අතු  ර

147 පූ රා  පෙරුම් බුදුකුරු බවට එන ඔ  බ
කා රා  ආම් සැලකරණට මෙතතු පූ  බ
හැ රා  ඉන් ඔහුගෙ සැම උවදුරු දුල  බ
ද රා  අන් පතැති මුත් මැනවි ගත ලැ  බ

148 එ  බෝ තු ල  තෙදැති සවතිඳු ගෙන් පෙ  ම
ලැ  බෝ කා ල  සැම සුබ ආසිරි බෝ  ම
කොබෝ නි ල  මිතුරෙ සමගිව සියසැ  ම
තොබෝ කා ල  යෙහෙන් පවතුව සැපයේ  ම

නිමි